## තිරසර සංවර්ධන දර්ශකයන්ට අදාළව කාන්තාවන්ට එරෙහි හිංසනය සම්බන්ධව පළාත් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන

**<u>පළාත් සභා ශ්‍රවණාගාරය - මධ්‍යම පළාත්සභාව</u>**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය ඒකාබද්ධව සංවිධානය කරන ලද තිරසර සංවර්ධන දර්ශකයන්ට අදාළව කාන්තාවන්ට එරෙහි හිංසනය සම්බන්ධව පළාත් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන 2018.06.05 වන දින මධ්‍යම පළාත් සභා ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි. මේ සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය ඇතුළු මධ්‍යම පළාත්සභාවේ රාජ්‍ය නිලධාරීන් 120 ක් පමණ සහභාගී විය.

පළමුව මධ්‍යම පළාත් කාන්තා ගීතය ගායනා කිරීම සිදු කරන ලදි. ඉන් අනතුරුව මෙම වැඩසටහන ආරම්භ කරමින් මධ්‍යම පළාත් සභාවේ පළාත් කර්මාන්ත හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් කුමුදු කරුණාරත්න මහත්මිය පැමිණ සිටින පිරිස පිළිගනිමින් සිය අදහස් දැක්වීම සිදු කරන ලදි.



තිරසර සංවර්ධන දර්ශකයන් ප්‍රධාන ආර්ථික දර්ශකයක් වන අතර එයට සමගාමීව කාන්තාවන් ඉලක්ක කර ගනිමින් වෘත්තීය පුහුණු වැඩසටහන් රාශියක් මේ වන විටත් පවත්වාගෙන යන බව පවසන ලදි.

ඒ අනුව,

- තිර රෙදි නිර්මාණය, මෝස්තර නිර්මාණ කටයුතු
- රූපලාවන්‍ය සේවා
- මැහුම් පුහුණු පාඨමාලා, පැච් වර්ක්, ඇඳුම් නිර්මාණ කටයුතු
- ආහාර නිෂ්පාදනය
- 2018 තිරසර සංවර්ධන ඉලක්ක යටතේ ක්ෂුද්‍ර මැදරට ණය යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා ණයමුදල් ලබා දීම.

තවද මධ්‍යම පලාත තුල කාන්තා වැඩසටහන් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වුවද එම පවතින ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් මධ්‍යම පළාත තුල පවතින කොට්ඨාශ 36 ම ආවරණය කරමින් වැඩසටහන් ව්‍යාප්ත කර ඇති බවත් එමගින් මධ්‍යම පලාත තුල කාන්තා කටයුතු සාර්ථකව සිදු වන බවත් පවසන ලදි.

එමෙන්ම විල්ගමුව, ලග්ගල පල්ලේගම, වලපනේ, මිනිපේ, උඩුදුම්බර යන ප්‍රදේශයන්හි වනිතා සංවර්ධන නිලධාරීන් නොමැති බැවින් එම ප්‍රෙද්ශයන්හි ව්‍යාපෘති කිරීමේදී ගැටළු පවතින බවත් පවසන ලදි.

**අරමුණ පැහැදිලි කිරීම - ජාතික කාන්තා කමිටුවේ සභාපති ස්වර්ණා සුමනසේකර මහත්මිය**

ජාතික කාන්තා කමිටුව 2016 වසරේ සිටපළාත්සභා හා ඒකාබද්ධව ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවී මූලප්‍රවාහකරණය පිළිබඳ පවත්වන ලද වැඩසටහන් පිළබඳවද සිහිපත් කරන ලදඅතරවැඩි ජනගහණයක් ව්‍යාප්ත වී ඇති ග්‍රාමීය ප්‍රදේශයන්ද ආවරණය වන පරිදි පළාත්සභාවන්හි වැඩසටහන් පැවැත්වීමේ ඇති වැදගත්කමද පැහැදිලි කරන ලදි. තිරසර සංවර්ධන දර්ශකයන්හි 5 වන දර්ශකය වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියළු කාන්තාවන් සහ ගැහැණු දරුවන් සවිබල ගැන්වීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන් පැවැත්වීමට කටයුතු කල යුතු බවද අවධාරණය කරන ලදි. තවද,මානව අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම,ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය මත පදනම් වූ හිංසනයන් පිටු දැකීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම හා කාන්තා ගෘහමූලික සංකල්පය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳවද පැහැදිලි කරන ලද අතර පළාත්සභාවන්හි කටයුතු කිරීමේදී එම ක්‍රියාකාරී සැලසුම් යොදාගැනීම පිළිබඳවද පැහැදිලි කරන ලදි.

**මානව අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම**

මානව අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කාන්තාවන් හා ළමයින් සම්බන්ධ පරිච්ඡේදය ක්‍රියාත්මක කිරීමේ වගකීම කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයට පවතින අතර එය ක්‍රියාත්මක කිරීම පළාත්සභා හා ඒකාබද්ධව සිදු කල යුතුය. එහිදී පහත කාර්යයන් පිළිබඳ අවධානය යොමු කල යුතුය.

- කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියා කිරීම, කාන්තා කොමිෂමක් පත් කිරීම, ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් කර හදුනා ගත් දත්ත දත්ත රැස් කිරීම
- යුද්ධයෙන් අවතැන් වූ කාන්තාවන් සම්බන්ධව කටයුතු කිරීම
- තීරණ ගන්නා මට්ටම් වල කාන්තා නියෝජනය, කාන්තාවන්ගේ සෞඛ්‍ය , අධ්‍යාපනය පිළිබඳ අවධානය යොමු කිරීම
- ගර්භණී මවුවරුන්ගේ සෞඛ්‍ය - නීති ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා පසු විපරම
- කාන්තාවගේ ආර්ථික කටයුතු පිළිබඳ අවධානය යොමු කිරීම - වෘත්තීය පුහුණු ආදිය පැවැත්වීමේදී සම්ප්‍රදානුකූල ක්‍රමයන්ගෙන් බැහැරව නව තාක්ෂණය යොදාගත් පුහුණු ප්‍රවර්ධනය කිරීම
- ගොවි සංවිධාන කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම

- කාන්තාවන්ගේ ගැටළු අවම කිරීම කාන්තාවන් පිළිබඳ පවතින ඒකාකරී ප්‍රතිරූපය වෙනස් කිරීම
- අධ්‍යාපනය- කාන්තාවන්ගේ එකාකාරී බව වෙනස් කිරීම ඒ සඳහා පෙලපොත් වෙනස් කිරීම, සිතුවිලි වෙනස් කිරීම. තොරතුරු තාක්ෂණය භාවිතය, ලිංගික අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම
- කාන්තා දේශපාලන සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම

තවද මෙම සැලැස්මෙහි එක් එක් ක්‍රියාකාරකම් සිදු කල යුතු කාලසීමාවන්ද දක්වා ඇති අතර ඒ අනුව මෙම සැලැස්ම ක්‍රියාත්මක කල යුතුය. එමෙන්ම 2019 සැලසුම් සකස් කිරීමේදී මෙම කරුණු පිළිබඳ අවධානය යොමු කර සැලසුම් සකස් කිරීම සිදු කල යුතු අතර ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව පිළිබඳ පවතින මතවාද වෙනස් කර ගැනීමට හා ජාත්‍යන්තර වශයෙන් අරමුදල් සපයා ගැනීමටද මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

**ගෘහ මූලික පවුල් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම**

කාන්තාවන්ගේ කායික හා මානසික සෞඛ්‍ය,සේවාවන් ලබා දීම, ස්වයං රැකියා, කාන්තාවන්ගේ ආරක්ෂණය,, ළමා රැකවරණ මධ්‍යස්ථාන වැනි පහසුකම් සැලසීම,කාන්තා හිංසනයට එරෙහිව පවතින ආරක්ෂාව, උපදේශනය ලබා දීමේ අවශ්‍යතාවය, ග්‍රාමීය මටටමින් දැනුවත් කිරීම මෙම ක්‍රියාකාරී සැලැස්ම යටතේ අන්තර්ගත වේ. මේ සඳහා විදේශාධාර මෙන්ම භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වීම සිදු කල හැකි අතරම කාන්තා හිංසනයට එරෙහිව වැඩසටහන් දියත් කිරීම සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කර ක්‍රියාත්මක කල යුතුය.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය මත පදනම් වූ හිංසනයන් පිටු දැකීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම**

ස්ත්‍රී පුරුෂ සමාජභාව සාධාරණත්වය හා සමානාත්මතාවය ආරක්ෂා කිරීම සඳහා හිංසනය වැළැක්වීම, එවන් තත්වයන්හිදී මැදිහත්වීම හා එය වැළැක්වීමට ක්‍රියාත්මක වන ආකාරය අන්තර්ගත කරමින් සකස් කරන ලද සැලැස්මකි. මෙම සැලැස්ම අංශ 09 ක් ආවරණය කරමින් සකස් වූවකි. එනම් ළමා කටයුතු, ආපදා කළමනාකරණය, ආර්ථික සංවර්ධන හා රැකියා, අධ්‍යාපනය, බලගැන්වීම හා නිවාරණය, විදේශ රැකියා සෞඛ්‍ය, අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ හා මාධ්‍ය යන ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත වේ. මෙම ක්‍රියාකාරී සැලැස්මද ක්‍රියාත්මක කිරීම සඳහා කල වකවානු අන්තර්ගත කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීමද පළාත්සභා ඒකාබද්ධව කල යුතුය.
ඒ අනුව 2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කිරීමේදී මෙම ක්‍රියාකාරී සැලසුම් කෙරෙහිද අවධානය යොමු කර ක්‍රියා කිරීම තුලින් වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබා ගනිමින් කාන්තා හා ළමා ගැටළු අවම කර ගැනීමට හැකියාව ලැබේ.

**තීරණ ගන්නා මට්ටම් වල කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම - මහාචාර්ය කමලා ලියනගේ මහත්මිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංකල්පය හා එම සංකල්පය සමාජ ප්‍රශ්ණයක් බවට පත් වී ඇති ආකාරය පැහැදිලි කරන ලදි. එමෙන්ම ලංකාවේ තීරණ ගන්නා මට්ටම් වල කාන්තා සහභාගීත්වයේ දැනට පවතින තත්වය හා තීරණ ගන්නා මට්ටම්වල කාන්තා සහභාගීත්වයක් පැවතිය යුත්තේ ඇයි යන්න පිළිබඳ කරුණු දක්වන ලදි. එමෙන්ම තිරසර සංවර්ධනයක් ඇති කිරීමට ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයක් පවත්වාගෙන යා යුතු අතර කාන්තා ශ්‍රම දායකත්වයද දායක කර ගත යුතුය. එහිදී තිරසර සංවර්ධනයක් ළඟා කර ගැනීමට නම් පහත ප්‍රෙවිශයන් අනුගමනය කල යුතුය.

- සමානාත්මතා තර්කය
- නියෝජන තර්කය
- අත්දැකීම් පිළිබඳ තර්කය

  දෙපාර්ශවයේම අත්දැකීම් මත පදනම්ව තීරණ ගැනීම තුලින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී තීරණ ගත හැකි වීම තුලින් තිරසර සංවර්ධනය කර ා ගමන් කල හැකිය.

- උපයෝගීතා තර්කය

  තිරසර සංවර්ධන දර්ශකයන්ට අදාලව සංවර්ධනය කරා ගමන් කිරීමේදී කාන්තා ශ්‍රමය අපතේ යාමක් සිදු නොවන ආකාරයට ශ්‍රම දායකත්වය ලබා ගත යුතුය.

ශ්‍රී ලංකාවේ අයවැය සම්පාදන , ප්‍රතිපත්ති සම්පාදන හා තීරණ ගැනීමේ කටයුතු සිදු කරන ප්‍රධාන ආයතනයක් වන පාර්ලිමේන්තුව, කැබිනට් මණ්ඩලය හා පළාත්සභා තුල කාන්තා නියෝජනය ඉතා අවම මට්ටමක පවතී. මෙම ආකාරයට දේශපාලන ක්ෂේත්‍රය තුල කාන්තා සහභාගීත්වය අඩු වීම තුලින් ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී කාන්තා සහභාගීත්වයේ දායකත්වය අවම වීම තුලින් කාන්තාවන්ට සංවේදී ප්‍රතිපත්ති සැකසීම ගැටළුවක් බවට පත්ව ඇත.එබැවින් දේශපාලන ක්ෂේත්‍රය තුල කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමට පියවර ගත යුතුය.ඉන්දියාව වැනි රටවල විවිධ ක්‍රම මඟින් කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය කර ඇති අතර ලංකාවේද එවැනි ක්‍රම මඟින් අනුගමනය කල හැකිය.

පරිපාලන ක්ෂේත්‍රය දෙස අවධානය යොමු කිරීමේදීද පැහැදිලි වන්නේ, අමාත්‍යාංශ මට්ටමෙන් ලේකම්වරියන්ගේ, ස්වාධීන කොමිෂන් සභාවන්හි ඉහල මට්ටමේ කාන්තා නිලධාරිනියන්ගේ, දිස්ත්‍රික් ලේකම් වරියන්ගේ හා අධිකරණ ක්ෂේත්‍රෙයද නීතිඥවරියන්ගේ නියෝජනය අවම මට්ටමක පවතින බවයි. එය විවිධ හේතූන් මත තිරණය වන නමුත් එවැනි ක්ෂේත්‍රයන්ගේද කාන්තා සහභාගීත්වය වර්ධනය කල යුතුය.

තවද, පළාත් මට්ටමින් වැඩසටහන් සැලසුම් කිරීම, නීති ප්‍රතිපත්ති සැකසීම, සංයුතිය සැකසීම හා සම්පත් බෙදා වෙන් කිරීමවැනි කටයුතු වලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීභාවය ඇති කර ගැනීම වැදගත් වේ. එමඟින් තිරසර සංවර්ධන ඉලක්ක කරා ලගා වීමද පහසු වේ.

**තිරසර සංවර්ධන දර්ශකයන්ට අදාලව කාන්තාවන්ට සමානාත්මතාවය ලබා දීම - මහාචාර්ය කමලා ලියනගේ මහත්මිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

තිරසර සංවර්ධන අරමුණු 17 සාරාංශගතව පැහැදිලි කිරීම සිදු කරන ලද අතර එහි 5 වන අරමුණ වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලදි. එහිදී,

- කාන්තාවන්ට හා ගැහැණු දරුවන්ට එරෙහිව සිදු වන්නා වූ වෙනස්කොට සැලකීම තුරන් කල යුතුය.
- කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඇතුලත්ව තාක්ෂණය ලබාගැනීම සඳහා සමාන අවස්ථා කාන්තාවන්ට ලබා දීම
- දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා සාමාන්‍ය ජීවිතයේ සියළුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගී වීම තහවුරු කිරීම
- පොදු ක්ෂේත්‍රයන්හි නායකත්වය ගන්නා කාන්තාවන්ගේ ප්‍රතිශතය වර්ධනය කිරීම කල
- සමීක්ෂණ සිදු කරන මට්ටමේ, ප්‍රතිපත්ති සකස් කරන කණ්ඩායම්හි කාන්තාවන් වැඩි කිරීම
- ස්ත්‍රීන්ට ස්වාධීන තීරණ ගත හැකි තත්වයක් ඇති කල යුතුය.
- රජයේ ඉඩම් හිමිකාරීත්වය පුරුෂයින්ට මෙන්ම ස්ත්‍රීන්ටද හිමිවිය යුතුය. එමෙන්ම ඉඩම් සම්බන්දයෙන් තීරණ ගැනීම මෙන්ම කළමනාකරණයද කාන්තාවන්ට හිමි විය යුතුය.

තිරසර සංවර්ධන අරමුණු වල අන්තර්ගත 5 වන අරමුණ කරා ළඟා වීමේදී ඉහත කරුණු කෙරෙහි අවධානය යොමු කල යුතු ආකාරය පැහැදිලි කරන ලදි.




මහාචාර්ය කමලා ලියනගේ මහත්මිය දේශණය පවත්වමින්....................

**කාන්තා හිංසනයන් අවම කිරීම පිලිබඳ පළාත්සභාවේ කාර්යභාරය - අනූෂා එදිරිසිංහ මහත්මිය, කැළණිය විශ්ව විද්‍යාලය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් කර ගත් හිංසනය, කාන්තා හිංසන තත්වයන්, හිංසනයේ ස්වභාවය අනුව වර්ගීකරණය හා මධ්‍යම පලාත තුල වාර්තා වී ඇති හිංසන තත්වයන් සංඛ්‍යාත්මක වශයෙන් පැහැදිලි කිරීම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ හිංසනයේ ස්වරූපයන් හා සමාජය තුල හිංසනයන් සිදු වන ආකාරය පිලිබඳ දැනුවත් කිරීම සිදු කරන ලදි.

තවද, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් සිදු කර ඇති අධ්‍යයනයන් හා එම හිංසනයන් සිදු වී ඇති ආකාරය සංඛ්‍යාත්මකව පැහැදිලි කිරීම, ලිංගික ප්‍රචණ්ඩත්වය, සමාජය තුල සිදු වන ලිංගික හිංසනයන් පිළිබඳවද සාකච්ඡා කරන ලදි.



අනූෂා එදිරිසිංහ මහත්මිය සිය දේශණය පවත්වමින්.................

තවද, භාරකාරීත්ව හිංසනය සිදුවිය හැකි අවස්ථා හා සිදුවන ආකාරය, කාන්තාවන්ට සිදුවිය හැකි භාරකාරීත්ව හිංසන වර්ග පිළිබඳ අවධානය යොමු විය. සංක්‍රමණික කාන්තාවන්ට එරෙහි හිංසනය, එම හිංසනයන්ගේ ස්වභාවය, සංක්‍රමනික කාන්තාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග, හා සමාජ මාධ්‍ය ජාලා භාවිතයෙන් සිදු වන හිංසනයන් පිළිබඳවද සාකච්ජා විය. එම පැහැදිලි කිරීමත් සමඟම පළාත්සභාවන් මෙම තත්වයන් අවම කිරීම සඳහා ක්‍රියා කල යුත්තේ කෙසේද යන්නත් අවධාරණය කරන ලදි. ඒ අනුව පහත කාර්යයන් පළාත්සභාවන්ට සිදු කලහැකි බවට යෝජනා කරන ලදි.

- පොලිසිය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හා ඒකාබද්ධව ගෘහස්ත හිංසන පනත පිලබඳ දැනුවත් කිරීම් සිදු කිරීම.
- විශ්ව විද්‍යාල තුල ලිංගික හිංසනයන් වැළැක්වීමට පියවර ගත යුතුය.

- සයිබර් අපරාධ සම්බන්ධව දැනුවත් කිරීම හා සයිබර් අපරාධ තුලින් වලකින ආකාරය පිළිබඳ ළමයින් දැනුවත් කිරීම සිදු කල යුතුය.
- සේවා ස්ථානයන්හි සිදු වන හිංසනයන් වැළැක්වීමට පියවර ගැනීම.
- Gender Focal point පත් කිරීම.
- ලිංගිකත්වය පිළිබඳ ජාතික මට්ටමින් හා පළාත්සභා මට්ටමින් දැනුවත් කිරීම.
- අඩු වයස් ගැබ් ගැනීම් පිළිබඳ පාසල් මට්ටමින් ගුරුවරුන්, ළමයින් හා දෙමාපියන් දැනුවත් කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පහල මට්ටමේ සිට ඉහල මට්ටමේ නිලධාරීන් දක්වා දැනුවත් කිරීම.
- කාන්තා දේශපාලන සහභාගීත්වය ප්‍රවර්ධනයට ක්‍රියාකිරීම හා ප්‍රතිපත්ති සම්පාදනයට කටයුතු කිරීම.
- මෙහෙයුම් පද්ධති තුල ස්ත්‍රී පුරුෂ සංවේදී භාවය ඇති කිරීම.
- පළාත් සභා තුලින් සකස් කරන සැලසුම් තුල ස්ත්‍රී පුරුෂ සංවේදී අයවැයකරණයක් ඇති කිරීම.

ජාතික කාන්තා කමිටුවේ සංවර්ධන සහකාර යුරානි වික්‍රමසිංහ මෙනවිය විසින් ස්තුති කතාව පවත්වමින් මෙම වැඩමුළුව සාර්ථකව සිදුකිරීමට හැකි වීම පිළිබඳ සහයදුන් සැමට ස්තුතිය පළ කරන ලදි. ප.ව. 2.30 ට පමණ වැඩසටහන නිමාවට පත්විය.

මධ්‍යම පළාත් සභාවේ මෙම වැඩසටහනට සමගාමී වැඩසටහන් පහත සඳහන් පළාත් සභාවන්හි ද මේ වනවිට සාර්ථකව පවත්වා අවසන් කර ඇති අතර නැගෙනහිර පළාතේ වැඩසටහන 2018 ඔක්තෝබර් 17 වන දින මඩකලපුව දිස්ත්‍රික්කයේ සර්වෝදය කලාපීය මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

| පළාත් සභාව | වැඩසටහන පැවැත් වූ දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| වයඹ | 2018.06.21 | 135 |
| සබරගමුව | 2018.08.09 | 104 |
| උතුරු මැද | 2018.08.16 | 85 |
| ඌව | 2018.09.06 | 102 |
| දකුණ | 2018.09.13 | 90 |